DOI : 10.31357/fhssphd.2004.00727

# ගාලු දිස්ත්‍රික්කයේ ශාන්තිකර්මවල අන්තර්ගත වාස්තු විද්‍යාත්මක ලක්ෂණ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මගින් පවත්වනු ලබන
දර්ශනසූරි උපාධිය
සඳහා ඉදිරිපත් කෙරෙන නිබන්ධය.

ලේඛ්‍යාරූඪ අංකය.
G.S./H.U./1121/2000.

**බෙන්තර හේවගේ ලයනල්**

සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ.

2004 මාර්තු.

# ගාලු දිස්ත්‍රික්කයේ ශාන්තිකර්මවල අන්තර්ගත වාස්තු විද්‍යාත්මක ලක්ෂණ.

08 MAR 2004

02 NOV 2004

ලේඛ්‍යාරූඪ අංකය.

G.S./H.U./1121/2000.

## උපදේශකවරයාගේ සටහන :

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ පශ්චාද් උපාධි පීඨයේ අංක ජීඑස්/එච්යූ /1121/2000 යටතේ ලියාපදිංචි බෙන්තර හේවගේ ලයනල් මහතා විසින් ඉදිරිපත් කරන ලබන ගාලු දිස්ත්‍රික්කයේ ශාන්තිකර්මවල අන්තර්ගත **වාස්තු විද්‍යාත්මක ලක්ෂණ** නම් වූ මෙම නිබන්ධය මාගේ අධීක්ෂණය යටතේ මැනවින් ඉටු කළ බව මෙහි ලා සහතික කරමි.

[illegible]

දිනය : 08/03/2004 අත්සන

උපදේශකවරයාගේ නම :

[illegible]

[illegible]

[illegible]

02/11/2004

# පිදුම.

දුක් කම්කටොලු මැද

මා මෙ ලොවට

බිහි කොට.......

සෙනෙහසේ අගය

පැහැදිලි කර දුන්

මෑණියන්ට

සහ

නිහතමානිකමේ

අගය වටහා දුන්

පියාණන්ටයි.

# ප්‍රවේශය

ගාලු දිස්ත්‍රික්කයේ ශාන්තිකර්මවල අන්තර්ගත වාස්තු විද්‍යාත්මක ලක්ෂණ නම් වූ මෙම නිබන්ධයේ විෂය ක්ෂෙත්‍රය, විෂය පරිමාණය හා පර්යේෂණ ක්‍රම වේදය, පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීම මෙහි ලා අපේක්ෂා කෙරේ.

**විෂය ක්ෂෙත්‍රය**

දේශීය ශාන්තිකර්ම හා වාස්තු විද්‍යාව වූකලි කාලන්තරයක් තිස්සේ මෙ රටට බල පෑ භාරතීය සංස්කෘතිය විසින් දායාද කරන ලද්දකි. ඒවා දේශානුකූල ව හා කාලානුරූප ව විවිධ සමාජ සංස්කෘතික අභියෝගවලට මුහුණ දෙමින්, විවිධ ඇදහිලි විශ්වාස පුද පූජා සමඟ මිශ්‍රණය ව අතීතයේ සිට මෙ රට පැවැති ශිල්ප ශාස්ත්‍ර විධි ඇතුළත් කලාවන් දෙකකි. අදෘශ්‍යමාන බලවේගයන් පූජ්‍යත්වයට පත් කොට වත්පිළිවෙත් පැවැත්වීමෙන් ලෞකික දිවිය සාර්ථක කර ගැනීම පිණිස සශ්‍රීකත්වය උදා කර ගැනීම ශාන්තිකර්ම පැවැත්වීමේ මූලික හරය ලෙස පිළිගැනෙන අතර මිනිසාට වාසය කිරීමට අවශ්‍යය පරිසරය සකස් කර ගැනීමේ ශිල්ප ධර්ම විද්‍යාව වාස්තු විද්‍යාවට ඇතුළත් වූ මූලිකාංගයෝ ය. විවිධ භූවිෂමතා සහිත ප්‍රදේශවල ජීවත් වන ගාලු දිස්ත්‍රික් වැසියෝ ද තමා අවට පරිසරය මත ගොඩ නගා ගත් ඇදහිලි විශ්වාස පද්ධතියක් ආශ්‍රිත ව ජීවත් වූහ. ඒ අනුව ශ්‍රී ලාංකේය සිංහල බෞද්ධයන් අතර පවත්නා ශාන්තිකර්ම කිහිපයකි.[1] වෙනත් ජන ඇදහිලිවලට සමගාමී ව ඒවාට පාදක වූ ජනශ්‍රැති/ජනප්‍රවාද රාශියක් ද පවතී. ඒවා පශ්චාත්කාලීන ලිඛිත සාහිත්‍යයට බලපා ඇත. ඒ අනුව ජනශ්‍රැති හා ශාන්තිකර්ම සාහිත්‍යයත්, ගාලු දිස්ත්‍රික්කය පුරා ශාන්තිකර්ම පැවැත්වීමේ දී හා විවිධ නිර්මාණ කටයුතුවල දී යොදා ගන්නා ශිල්ප ශාස්ත්‍ර නියමයන් පිළිබඳ පාරම්පරික අවබෝධයත්, ඒවායේ ඓතිහාසික ගමන් මඟ පිළිබඳ අධ්‍යයනය කිරීමත් මෙහි විෂය ක්ෂේත්‍රය වෙයි. එම විෂය ක්ෂේත්‍රය ප්‍රවේශය සඳහා

---

1. **සටහන**: බෞද්ධාගමික මුහුණුවරින් පවත්වනු ලබන පිරිත් සජ්ඣායනා, බෝධි පූජා මෙන් ම, අංකෙළිය, පොරපොල් කෙළිය වැනි ජන ක්‍රීඩා විශේෂ ද, ශාන්තිකර්ම ශිල්පියෙකු ලවා පැය දෙක තුනක පමණ කාලය මිඩංගු කොට ඉටු කරවා ගනු ලබන තෙල් මැතිරවීම, නූල් බැඳීම, දෙහි කැපීම වැනි වත්පිළිවෙත් විශේෂ ද ශාන්තිකර්ම ගණයේ ඇතුළත් කළ හැකි ය. එහෙත් මෙම අධ්‍යයනයෙහි ලා සුවිශේෂී වනුයේ ශිල්පීන් ඊයකගේ සහභාගීත්වයෙන් සර්වරාත්‍රික ව පවත්වනු ලබන දෙවියන්, යකුන් හා ග්‍රහයන් මුල් කොට ගත් ශාන්තිකර්ම බව සැලකුව මනා ය. (**සටහන**: කෙටි කිරීම **සට**: යනුවෙනි.)

ශාන්තිකර්ම සහ ඒවායේ පසුබිම් සැරසිලි නිර්මාණ අංග පහළවීම පිළිබඳ වත්, වාස්තු විද්‍යාව ඒවාට සම්බන්ධ වනුයේ කවර පසුබිමක් අනුව දැයි පැහැදිලි කිරීම වැදගත් වේ.

ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය නොයෙක් සම්පත් සහ උපක්‍රම සොයා ගැනීමේ ආශාව මිනිසාගේ පරිණාමයත් සමඟ ගොඩ නැගුණු ක්‍රියාවලියකි. එම විකාශනය කෙතරම් දුරට සිංහල ගැමි සමාජය කෙරෙහි බලපා ඇද්ද යන්න දරුවකු පිළිසිඳ ගැනීමේ පටන් කෙනකු මිය යාමෙන් පසු දක්වා ඉටු කෙරෙන විවිධ වත්පිළිවෙත් හා ශාන්තිකර්මවලින් පැහැදිලි වෙයි. තමන්ට පාලනය කර ගත නො හැකි ආපදා අර්බුද ඇති වූ කල්හි දෙවියන්ට හෝ යකුන්ට හෝ කන්නලව් කොට වත්පිළිවෙත් පවත්වා ශාන්තිය ලබා ගැනීමට හැකි වෙතැ යි ගැමියෝ විශ්වාස කළහ. එහෙයින් ශාන්තිකර්ම යනු ගැමි ජනතාව විසින් විවිධ රෝග, උපද්‍රව දුරුකරවා ගැනීම පිණිස පවත්වනු ලබන ඔවුන්ට ආවේණික වත්පිළිවෙත් විශේෂයකි. මේ වත්පිළිවෙත්වලට පාදක වී ඇති ඇදහිලි විශ්වාස විමසා බැලීමේ දී ඒවා ප්‍රාග් බෞද්ධ යුගයේ පටන් පැවත එන ප්‍රාථමික ගැමි ඇදහිලි හා පුද පූජා පදනම් කර ගෙන හැඩ ගැසී ඇති බව පැහැදිලි කරුණකි.

ස්ථිර වාසස්ථානයට පත් මිනිසා තමාට අවශ්‍ය කෙරෙන ඉඳුම් හිටුම් පටන් ඉවුම් පිහුම්, ඇඳුම් පැලඳුම් ආදිය දක්වා විවිධ සම්පත්, මෙවලම් හා උපක්‍රම පරිහරණය කිරීම කාලාන්තරයක් තිස්සේ සිදු වූ විකාශනයක ප්‍රතිඵලයකි. ඒවා නිර්මාණය කිරීමේ ශිල්ප ක්‍රම උචිත ද්‍රව්‍ය හා අවශ්‍ය කෙරෙන මිම් ප්‍රමාණ තෝරා ගැනීම මිනිසාගේ පැවැත්මට සුදුසු තත්ත්වයෙන් තිබිය යුතු ය, යන සංකල්පය මුල් කොට ගත් වාස්තු විද්‍යාත්මක අංග නිසි ලෙස යොදා ගැනීම හෝ පරිහරණය නො කිරීම ද, කෙනෙකුගේ විනාශය කෙරෙහි බල පැවැත්වීමට හේතු වේ යැයි ඇතමෙක් සිතති. මේ නිසා අශුභ කටයුතුවලින් මිදී ශුභවාදී ව කෙනෙකු ජීවත් කරවීම සඳහා සිදු කෙරෙන ශාන්තිකර්මවල දී ශිල්පීන් විසින් ඉටු කළයුතු කාර්ය භාරය බොහෝ ය. ඒ ඒ ශාන්තිකර්මයට අදාළ සැරසිලි, පැලඳුම් ආදි සියල්ල නියමිත ආකාරයට නිර්මාණය කිරීම ඔවුන් සතු වගකීමක් ලෙස පිළිගැනේ. එබැවින් පෙරදිග වාස්තු විද්‍යාව සම්බන්ධයෙන් ගොඩ නැගී ඇති සාහිත්‍යය කෘති මෙන් ම, ගාලු දිස්ත්‍රික්කයේ ජනප්‍රිය ව පවත්නා ගැමි ඇදහිලිවලට හා විවිධ කලා නිර්මාණවලට පාදක වන කලා ශිල්ප ක්‍රම පරිශීලනය කොට ගාලු දිස්ත්‍රික්කයෙහි ශාන්තිකර්මවල ඇතුළත් මඩු/මණ්ඩප, සැරසිලි, පූජා භාණ්ඩ, රංග භාණ්ඩ, ඇඹුම්, පූජා පෙළපාලි හා බද්ධ විවිධ ඇඳුම් පැලඳුම් හා වෘත චාරිත්‍ර ආදිය මෙම නිබන්ධනයේ විෂය ක්ෂේත්‍රය ලෙස තෝරා ගැනේ.

## විෂය සීමාව

ශාන්තිකර්ම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ උඩරට, පහතරට, සබරගමු, ඌව, නුවර කලාවිය ආදි වශයෙන් ප්‍රදේශ හා පළාත් අනුව විෂයානුබද්ධ පුළුල් වපසරියක් දක්නට ඇත. එහෙත් දකුණු හා බස්නාහිර පළාත්හි ප්‍රචලිත පහතරට නැටුම් ශෛලිය ආශ්‍රිත ව පවත්නා ශාන්තිකර්ම අතුරෙන් ගාලු දිස්ත්‍රික්කයට අයත් ශාන්තිකර්ම පමණක් මෙම පර්යේෂණයේ විෂය සීමාව ලෙස සැලැකේ. එහි දී මාතර, බෙන්තර හා රයිගම යන ගුරුකුලවලට අයත් ශාන්තිකර්ම සැරසිලිවලට මිශ්‍ර වූ වෙනත් අලංකරණ කටයුතු ද අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය. විශේෂයෙන් එකී ගුරුකුල සම්මිශ්‍රණයෙන් දක්නට ලැබෙන ශාන්තිකර්ම සැරසිලි හා සෙසු ශිල්පීන් එක් වූ සංස්කෘතික හුවමාරු හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයක් කිරීම ද අපේක්ෂිත ය. මේ නිසා පහතරට නැටුම් ශෛලියට අයත් ජනප්‍රිය ශාන්තිකර්ම පවත්නා දකුණු පළාතේ ගාලු දිස්ත්‍රික්කය මෙම අධ්‍යයනයේ විෂය සීමාව ලෙස තෝරා ගැනේ.[1]

## විෂය කාල පරිමාණය

මෙම අධ්‍යයනය හා සම්බන්ධ විෂය කාල පරිමාණය පුළුල් වශයෙන් සලකා බලන විට එය විජයාවතරණයට පෙර පටන් දහ අට වන සියවස දක්වා යොදා ගත හැකිය. එහෙත් මෙහි ලා අනුරාධපුර, පොළොන්නරුව, දඹදෙණිය, ගම්පොළ, කෝට්ටේ හා මහනුවර රාජ්‍ය වකවානු තුළ දක්නට ලැබෙන විෂයානුබද්ධ වැදගත් අවස්ථා කෙරෙහි පමණක් විශේෂ අවධානය යොමු කෙරේ. එහි දී අද්‍යතන ශාන්තිකර්ම සැරසිලි කෙරෙහි ඒවා බලපා ඇති අයුරු විමසීමට ලක් කෙරෙනු ඇත. එහි ලා සමකාලීන ව විදේශීය සංස්කෘතිවලින් පෝෂණය වූ මෙ රට ඇදහිලි විශ්වාස සඳහා භාවිත කළ සංස්කෘත, පාලි, සිංහල ආදි භාෂාවලින් රචිත ග්‍රන්ථ සහ සිංහල යාග කවි කෙරෙහි ද, වාස්තු විද්‍යාව සම්බන්ධයෙන් මෙ රට භාවිත විවිධ ග්‍රන්ථ කෙරෙහි ද විශේෂ අවධානය යොමු කෙරේ.[2]

## පර්යේෂණ ක්‍රම වේදය

මෙම පර්යේෂණය සඳහා අනුගාමික පර්යේෂණ ක්‍රම විධි දෙකකි. පළමු ක්‍රමය වන්නේ ඓතිහාසික පාර්ශවයෙන් දත්ත විශ්ලේෂණය කිරීම යි. දෙ වන ක්‍රමය මානව විද්‍යාත්මක දෘෂ්ටියෙන් සහභාගිත්ව නිරීක්ෂණය සහ ප්‍රත්‍යායික අධ්‍යයනය මගින් තොරතුරු විශ්ලේෂණය කොට පර්යේෂණ ක්‍රම වේදයට අවතීර්ණ වීම යි.

1. ගාලු දිස්ත්‍රික්කය පැහැදිලි කෙරෙන සිතියමක් අංක 01 යටතේ චිත්‍රාවලියෙහි i පිටුවට ඇතුළත් කොට ඇත.
2. **සටහන:** පරිශීලනය කරන ලද එ වැනි කෘති කිහිපයක් මූලාශ්‍රය හැඳින්වීම හා ඇගයීම යටතේ මතු විස්තර කෙරේ.

## ඓතිහාසික විශ්ලේෂණය

ඓතිහාසික විශ්ලේෂණයට අනුව මෙම අධ්‍යයන ක්ෂේත්‍රයට ඉඳුරාම අදාළ වූ ද, වක්‍ර ව සම්බන්ධ වන්නා වූ ද ඓතිහාසික ලිපි ලේඛන ඒක රාශි කොට විමර්ශනය කිරීම අප ගත් එක් මාර්ගයකි. ගැමි ශාන්තිකර්ම කෙරෙහි වාස්තු විද්‍යාව බල පෑ අයුරු හා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ නිරූපණය කෙරෙන ආකාරය පිළිබඳ ලියවුණු ලිපි ලේඛන විරල වීම පර්යේෂණයෙහි ලා දුෂ්කර කාර්යයක් වුවත්, වාස්තු විද්‍යාව සම්බන්ධයෙන් කරුණු එක් රැස් කර ගත හැකි ඓතිහාසික ග්‍රන්ථ මගින් යම් බඳු ප්‍රමාණයකින් හෝ අවශ්‍ය දත්ත සපයා ගැනීමට හැකිවීම මෙහි ලා වැදගත් විය. එහි දී දනට මුද්‍රණද්වාරයෙන් බිහි ව ඇති විෂයානුබද්ධ විවිධ පත පොත, ජාතික කෞතුකාගාරය, ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව හා පාරම්පරික ශාන්තිකර්ම සහ වෙනත් කලා ශිල්පීන් සතු පුස්කොළ පොත්, අත්පිටපත්, මෙහි ලා පරිශීලනය කිරීමට හැකි විය. එ මගින් ශාන්තිකර්ම ක්ෂේත්‍රය හා වාස්තු විද්‍යාව සම්බන්ධ මෙතෙක් කිසිදු විද්වතකුගේ අවධානයට ලක් නො වූ මූලාශ්‍රයය කිහිපයක් හඳුනා ගැනීමට හැකි වීම සතුටට කරුණකි. එම මූලාශ්‍රය ඓතිහාසික විමර්ශනයට තුඩු දෙන අර්ථ දර්ශනයක් අනුව මෙම නිබන්ධය ඉදිරිපත් කිරීමට බෙහෙවින් උපකාරී විය.

## සහභාගීත්ව නිරීක්ෂණය

සහභාගීත්ව නිරීක්ෂණය මානව විද්‍යාවේ ප්‍රකට ය. එම ක්‍රමයට අනුව සෘජුව ම කටයුතු කළේ අදාළ ප්‍රස්තුතයට ලක් වූ ගාලු දිස්ත්‍රික්කයේ ශාන්තිකර්ම පැවැත්වෙන ස්ථානවලට ගොස් ශාන්තිකර්ම නිරීක්ෂණයෙන් අත්‍යවශ්‍ය කරුණු එක් රැස් කර ගැනීම යි. මේ සඳහා නිරීක්ෂණය කරන ලද ශාන්තිකර්ම පිළිබඳ විස්තර ද, ඒවා පවත්වන ලද ස්ථාන ද, සහභාගි වූ පුද්ගලයන් පිළිබඳ තොරතුරු ද, මූලාශ්‍රය හැඳින්වීම හා ඇගයීම යටතේ විස්තර දක්වා ඇත. එහි දී ශාන්තිකර්ම ශිල්පීන් වශයෙන් කටයුතු කරන කපුවන්, බලි ඇදුරන්, යකැදුරන් හා බෙර වාදකයන් සමඟ විෂයානුබද්ධ කරුණු සාකච්ඡා කොට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමයි. ඊට අමතර ව ඒ ඒ ශිල්පීන් ගේ නිවෙස්වලට ගොස් ඔවුන් සතු ව පැවැති අත් පිටපත් හා පුස්කොළ පිටපත් ආදියෙන් අවශ්‍ය කෙරෙන දත්ත එක් රැස් කර ගැනිණ. ඒවායින් ලබා ගත් තොරතුරු ශාන්තිකර්මවල ඇතුළත් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ විමසා බැලීමේ දී බෙහෙවින් ප්‍රයෝජනවත් විය. මේ හැරුණු විට අදාළ විෂයක්ෂේත්‍රය පුරා දක්නට ලැබෙන ඉපැරණි ආගමික සිද්ධස්ථාන සහ පෞරාණික නටබුන් වශයෙන් පවත්නා ගාලු කොටුව ඇතුළු ප්‍රදේශයේ දක්නට ලැබෙන වලව් කිහිපයක් නිරීක්ෂණය කිරීමෙන් අධ්‍යයනයට ලක් කළ ශාන්තිකර්මවල දක්නට ලැබෙන ගෘහ නිර්මාණ ලක්ෂණ විමර්ශනයට ඉතා වැදගත් විය. එමෙන් ම ගාලු දිස්ත්‍රික්කයේ වෙසෙන වාස්තු

විද්‍යාවන්ට සම්බන්ධ විවිධ කලා නිර්මාණ හා ඉදිකිරීම් කටයුතුවල නිරත ප්‍රවීණ ශිල්පීන් හමුවීම සහ ඔවුන්ගේ ප්‍රායෝගික නිර්මාණ ක්‍රියාවලීන් දැක බලා හඳුනා ගැනීම මෙම අධ්‍යයනයෙහි ලා වැදගත් විය. එකී ශිල්ප ශාස්ත්‍ර අතරට විහාර දේවාල නිර්මාණය සහ වඩුකාර්මික හා ගෘහ නිර්මාණ ශිල්පය ද, ගල්, දැව, ඇත්, දත්, කැස්බෑ ලෙලි ආදි කැටයම් ශිල්ප ද, පාරම්පරික වාත්තු ක්‍රම, ආයුධ හා ආභරණ තැනීමේ ශිල්ප ක්‍රම ද, වෙසෙසින් අධ්‍යයනය කෙරේ.

## ප්‍රත්‍යෙක අධ්‍යයනය

ප්‍රත්‍යක්‍ෂ අධ්‍යයනය යටතේ විෂයානුබද්ධ කරුණු පිළිබඳ අවබෝධයක් ඇතැයි පෙනී ගිය සුවිශේෂ පුද්ගලයන් මුණ ගැසීම හා ඔවුන් සමඟ සාකච්ඡා පැවැත්වීමු. එහි දී ඉහත සඳහන් කළ විෂයානුබද්ධ පාරම්පරික ශාන්තිකර්ම ශිල්පීන් සහ විවිධ කැටයම් හා කලා නිර්මාණවල නිරත විශේෂ පුද්ගලයන් හැරුණු විට විහාර, දේවාල හා පල්ලිවලට අයත් පූජ්‍ය පක්‍ෂය හා ගාලු දිස්ත්‍රික්කයේ වෙසෙන ඉපැරණි ප්‍රභූ නිවාස කිහිපයක හිමියන් හා විශ්වවිද්‍යාල ආචාර්ය, මහාචාර්ය කිහිපදෙනකු ඇතුළු විවිධ තරාතිරමේ පුද්ගලයන් රැසක් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්විණ. එම දත්ත ඉදිරිපත් කිරීම සඳහා වැදගත් වන ආකෘතික හා අනාකෘතික වශයෙන් හඳුන්වනු ලබන පිළිගත් පර්යේෂණ විධි ක්‍රම දෙක අප අනුගමනය කළෙමු.

මෙම නිබන්ධයට කරුණු එක් රැස් කිරීමේ දී පර්යේෂණ ක්‍රමවේදයට අයත් පූර්වෝක්ත ක්‍රම විධිවලට අනුව එක් රැස් කළ දත්ත වර්ගීකරණය කොට ඒවායේ ඇති ගුණාත්මක වටිනාකම් ඇගයීමට ලක් කොට මෙම නිබන්ධය සකස් කෙරිණ. එම ක්‍රියාවලියේ දී ප්‍රායෝගික පහතරට ශාන්තිකර්ම ශිල්පියකු වශයෙන් වත්මන් ලේඛකයා විසින් ලත් අත්දැකීම් ද ඊට දායාද කරන ලදී.

# උපකාරානුස්මෘති

මෙම නිබන්ධය සම්පාදනය කිරීමේ දී අපට නන් අයුරින් උදව් උපකාර කළ අය බොහෝ ය. ඔවුන් සියල්ල කෘතවේදී ව සිහිපත් කෙරෙන අතර ඉන් කිහිපදෙනෙකු මෙහි ලා සඳහන් කිරීම අප සතු යුතුකමක් සේ සලකමු.

මෙම අධ්‍යයනයේ දී මාගේ උපදේශකවරයාණන් ලෙස ක්‍රියාකරමින් අවශ්‍ය උපදෙස් දී පීතෘ සෙනෙහසින් මා මෙහෙය වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ මහාචාර්ය එම්.ඩබ්ලිව්. විමල් විජේරත්න විද්වතාණන් භක්ති ප්‍රණාමයෙන් පළමු ව සිහිපත් කළ යුතු ව ඇත.

මෙ වැනි අධ්‍යයනයක අවශ්‍යතාව පසක් කර දෙමින් මතු නො ව නිරතුරු දිරි ගන්වමින් අප නැණ පහන ආලෝකමත් කරවීමට කටයුතු කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යෝෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් විද්වතාණන් හා එම විශ්වවිද්‍යාලයයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයේ මහාචාර්ය ආනන්ද ගුණසිංහ (විශ්‍රාමික) ගුරු පියාණන් යන දෙපළ දෙ වනු ව සිහිපත් කරනුයේ ගෞරවාන්විත භක්ත්‍යාදරයෙනි.

නිරතුරු අප දිරිමත් කරවමින් මතු නො ව යා යුතු මග පෙන්වමින් සෞන්දර්ය අධ්‍යයන ආයතන ඉතිහාසයේ මුල් වරට දේශීය පශ්චාද් උපාධි කටයුතු සඳහා පුරා වසරක කාලයක් අප වෙත දේශීය අධ්‍යයන නිවාඩු ලබා දී අධ්‍යයනාංශාධිපති වරයෙකු වශයෙන් මහත් කැප වීමෙන් කටයුතු කළ මහාචාර්ය මුදියන්සේ දිසානායක විද්වතාණන් ද, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ මහාචාර්ය ඒ.කේ. තන්ත්‍රිමුල්ල, ශාස්ත්‍ර පීඨාධිපති මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර, සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශාධිපති මහාචාර්ය සුනිල් ආරියරත්න යන විද්වතුන් ලෙන්ගතු භාවයෙන් අප වෙත දක්වන ලද ශාස්ත්‍රීය මෙහෙවර තෙ වනු ව ඉතා කෘතවේදී ව සිහිපත් කරමු.

විෂයානුබද්ධ විවිධ ගැටලු නිරාකරණයේ දී නන් අයුරින් දැනුම අවබෝධය ලබා දෙමින් තම වටිනා කාලය අප වෙත කැප කරමින් කටයුතු කළ මොරටුව විශ්වවිද්‍යාලයයේ පීඨාධිපති මහාචාර්ය නිමල් ද සිල්වා, කැලණිය විශ්වවිද්‍යාලයයේ මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරු, මහාචාර්ය නන්දසේන මුදියන්සේ (විශ්‍රාමික), ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ සේවය කොට දැනට විශ්‍රාමික මහාචාර්ය

චන්ද්‍රා වික්‍රම ගමගේ, මහාචාර්ය වෝල්ටර් මාරසිංහ හා මහාචාර්ය රත්න විජේතුංග ආදීන් අප වෙත ලබා දෙන ලද අනුපමේය ශාස්ත්‍රාවබෝධය මෙහි ලා කෘතවේදී ව සිහිපත් කරමි.

මෙම අධ්‍යයනයේ දී රාජකාරී කටයුතුවලින් හැකිතාක් දුරට නිදහස් කර දෙමින් අවශ්‍ය කෙරෙන විවේකී අධ්‍යයන පසුබිම අප වෙත ලබා දීමෙන් උපකාර කළ වත්මන් සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ නර්තන අධ්‍යයනාංශාධිපති. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධනපාල ඕවිටිගෙදර මහතාටත්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍යවතී රාජපක්ෂ මෙනෙවියටත්, ශ්‍රියාණි රාජපක්ෂ මහත්මිය ඇතුළු ආචාර්ය මණ්ඩලයේ සෙසු මහත්ම, මහත්මීන්ටත්, මගේ නිහතමානී උපහාරය මෙහි ලා පුද කළයුතු ව ඇත.

මෙම නිබන්ධය සැකැසීමේ දී දුර්ලභ පොත් පත් සපයා දීමෙන් හා ඒවා ලබා ගැනීමට අවශ්‍ය උපකාර කළ කිහිප දෙනෙකි. ඒ අතර ප්‍රවීණ නර්තන ශිල්පී රවිබන්දු විද්‍යාපති, ශාස්ත්‍රපති සෝමරත්න එදිරිසිංහ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශයෙහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන් රණසිංහ, කොළඹ විශ්වවිද්‍යාලයයේ (හොරණ) බටහිර මණ්ඩපයේ පී.එම්. පෙරේරා, සහ නාට්‍ය ශිල්පී සරත් කුමාරසිංහ යන හිතවතුන් මෙහි ලා සෙනෙහසින් සිහිපත් කරමි.

පරිශීලනය කළයුතු විෂයානුබද්ධ විශේෂ පොත පත හඳුන්වා දෙමින් මතු නො ව ඇතැම් වචනාර්ථ පැහැදිලි කර දෙමින් අප දැනුවත් කළ සිංහල ශබ්දකෝෂ කාර්යාලයයේ පණ්ඩිත කේ.බී.ඒ. එඩ්මන්ඩ් මහතාටත්, අවශ්‍ය තොරතුරු සපයා දෙමින් අප දැනුවත් කළ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, ආචාර්ය කේ.ඩී.ජී. විමලරත්න මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව හා ජන සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙහි සේවයේ නිරත නිලධාරීන්ටත්, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය, කැලණිය විශ්වවිද්‍යාලයය, සෞන්දර්ය අධ්‍යයන ආයතනය, කොළඹ ජාතික කෞතුකාගාරය, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, කොළඹ මහ නගර සභාව, හොරණ විද්‍යාරතන පිරිවෙණ හා හොරණ නගර සභාව යන ස්ථානයන්හි පිහිටි පුස්තකාලයන්හි සේවයේ නියුතු සියලු නිලයන්ටත්, අප ගේ කෘතඥතා පූර්වක ස්තුතිය මෙහි ලා පුද කරන්නෙමු.

ක්ෂේත්‍ර අධ්‍යයනයට අදාළ ශාන්තිකර්ම හා සුවිශේෂ ස්ථාන නරඹන්නට යාමේ දී හඬ පටිගත කර දීමෙන්, වීඩියෝ ගත කිරීමෙන් හා ඡායාරූප ගැනීමෙන් උදව් කළ කිහිප දෙනෙකි. ඒ අතර සෞන්දර්ය අධ්‍යයන ආයතනයෙහි සංගීත අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහින්ද සෙනෙවිරත්න, සමන් පනාපිටිය, ප්‍රවීණ නාට්‍ය හා ඡායාරූප ශිල්පී උදේනි අල්විස් හා නෝර්වේ ජාතික

හේගා මෙනවියත්, ප්‍රවීණ නර්තන ශිල්පී රංජිත් රත්නසිරි, හේමචන්ද්‍ර වීරසිංහ ඇතුළු රෝහණ පීරිස්, රංජිත් බද්දේගම, බුද්ධික, දේවිකා, සුසාමා, කාංචනා, සිසු සිසුවියන්ට ද ඉටු කළ කැපවීම වෙනුවෙන් අප ගේ ස්තුතිය පුද කරමු.

නිබන්ධයෙහි තිබූ ඇතැම් ඌනතා පෙන්වා දෙමින් හා නිවැරදි කර දෙමින් අප දැනුවත් කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කුසුමලතා ලංකාමුල්ල මහත්මියටත්, නිබන්ධයේ ඇතුළත් කරුණු පැහැදිලි කර දීම උදෙසා අවශ්‍ය රූ සටහන් චිත්‍රණය කර දුන් සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ චිත්‍ර හා මූර්ති අධ්‍යයනාංශයෙහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය රම්‍යවර්ධන පොඩිනිලමේ මහතාටත්, වචන අනුක්‍රමණිකාව හා ආශ්‍රිත ග්‍රන්ථාවලිය සකස් කර ගැනීමට උපකාර කළ හොරණ නර්තනගල ආරණ්‍ය වාසී පූජ්‍යපාද මාහිංගල සුමන පොඩි හාමුදුරුවන් හා ලොකු හාමුදුරුවන් ඇතුළු සැමටත්, අපගේ කෘතඥතාව හිමි වේ.

ශාන්තිකර්ම නරඹන්නට යාමේ දී අවශ්‍ය වූ ඉඳුම්-හිටුම්, නවාතැන් හා ආහාර-පානාදිය ලබා දුන් සියල්ලන්ටත්, ශාන්තිකර්ම ශිල්පීන් මෙන් ම දත්ත දායකයන් වශයෙන් උපකාර කළ විවිධ තරාතිරමේ හිතවතුන් විසින් දක්වන ලද අනුපමේය මෙහෙය ස්තුති පූර්වක සිහිපත් කරන්නෙමු.

නිබන්ධය පරිගණක ගත කොට ඉදිරිපත් කිරීමට අවශ්‍ය මුද්‍රිත පිටපත් ලබාගැනීම දක්වා දිවා රාත්‍රී නො තකා මහත් කැපවීමෙන් කටයුතු කළ සමන් දියතිලක හිතවතාට ද අපගේ කෘඥතා පූර්වක ස්තුතිය මෙහි ලා පළ කරන්නෙමු.

# අනුක්‍රමණිකා


| | |
|---|---|
| පිදුම | II |
| ප්‍රවේශය | III |
| උපකාරානුස්මෘති | VIII |
| අනුක්‍රමණිකා | XI |
| හැඳින්වීම | XIV |
| අන්තර්ගතය | XXII |
| සංක්ෂේපණය | XXIII |

**පළමු වෙනි පරිච්ඡේදය**

**මූලාශ්‍රය හැඳින්වීම හා ඇගයීම**

**ලිඛිත මූලාශ්‍රය** - මහාවංසය-ඓතිහාසික බෞද්ධ සාහිත්‍යය - දේශීය වාස්තු විද්‍යා සාහිත්‍යය - සිංහල ශාන්තිකර්ම සාහිත්‍යය. **අලිඛිත මූලාශ්‍රය** - ශාන්තිකර්ම නිරීක්ෂණය- සම්මුඛ සාකච්ඡා - ඡායාරූප - හඬපට හා වීඩියෝ පට - වෙනත් මූලාශ්‍රය. **01 - 21**

**දෙ වෙනි පරිච්ඡේදය**

**ගාලු දිස්ත්‍රික්කයේ ශාන්තිකර්ම**

**ගාලු දිස්ත්‍රික්කය** - ගාලු දිස්ත්‍රික්ක නාම භාවිතය- ඓතිහාසික මූලාශ්‍රය - ජනශ්‍රැතිමය තොරතුරු- භූවිෂමතා හා පරිසරය - ආගමික පරිසරය- ජනගහනය හා ආගම් - කුල ක්‍රමය- **කලාශිල්ප** - විවිධ කලාකරුවෝ- ඇදහිලි හා ශාන්තිකර්ම - **ශාන්තිකර්ම ශිල්පීහු** **22 - 40**

## තුන් වෙනි පරිච්ඡේදය

**පෙරදිග වාස්තු විද්‍යාව හා එහි දේශීය මුහුණුවර**

**වාස්තු විද්‍යාව නිර්වචනය කිරීම - දේශීය වාස්තු විද්‍යාව - දේශීය වාස්තු විද්‍යාත්මක ග්‍රන්ථ - වාස්තු විද්‍යාව හා අද්‍යතන ශාන්තිකර්ම - වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ හඳුනා ගැනීම**. ශිල්පියකු තෝරා ගැනීම. ස්ථානය හා ඉදිකිරීම් ක්‍රම, ජ්‍යෝතිෂ කටයුතු - පරිසරය සුරැකීම - අලංකරණ විධි භාවිතය - පාරිහාරික ගෘහ භාණ්ඩ පරිහරණය - මුළුතැන් ගෙයි උපකරණ පරිහරණය-පාරිහාරික අවි, ආයුධ භාවිතය - ඇඳුම් පැලඳුම් භාවිතය-සමාජීය පොදු අවශ්‍යතා භාවිතය- ජීවන වෘත්තීන් හා ශිල්ප/කර්මාන්ත සම්බන්ධ කර ගැනීම. 41 - 76

## සතර වෙනි පරිච්ඡේදය

**රඟමඬුලු සැරසිලිවල වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ**

**ශාන්තිකර්ම සැරසිලි - මඩු සැරසිලි** -කප් සිටුවීම- භූමිය සැකසීම - මඩුව නිර්මාණය-මඩුව සැරසීම- **මඩුව ඇතුළත ඉදි කෙරෙන වීදි සැරසිලි** - සූනියම් වීදිය හෙවත් අටමහල වීදිය, ගම්මඩු තොරණ, ශාන්තිකර්ම චිත්‍ර කලාව-**එළිමහන් වීදි සැරසිලි,** රටයකුන් වීදිය, මහසොහොන් වීදිය, සන්නි යකුම් වීදිය, කළුකුමාර වීදිය, තොටයක් වීදිය, රීරියක් වීදිය, කළුයක් වීදිය, ගරායක් අයිලය, පූනා වීදිය, **මල් යහන් සැරසිලි**-තොරණ සැරසිලි -**රඟමඬලෙහි විශේෂ වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ.** 77 - 121

## පස් වෙනි පරිච්ඡේදය

**මෙවලම් හා පැලඳුම්වල වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ**

**මෙවලම් භාවිතය** - මල් බලි සැකසීම - පිදේනි සැරසිලි - පිදේනි මැසි බැඳීම **පූජා වස්තු සැරසිලි - බිසෝකප, කාල පන්දම- ඇඳුම් පැලඳුම්**-කපුරෙදි මිශ්‍රිත ඇඳුම් පැලඳුම් - පබළු මිශ්‍රිත ඇඳුම් පැලඳුම්-සිරස් පලඳනා - කරමාල හා අත්පටි, ලෝහමය පලඳනා වෙස්මුහුණු පලඳනා - තාවකාලික පලඳනා- **පාරිහාරික ආයුධ නිර්මාණය - පරිසරගත ද්‍රව්‍ය ආශ්‍රිත භාණ්ඩ නිර්මාණය - සෙසු ගෘහ උපකරණ භාවිතය.** 122 - 154

**සය වෙනි පරිච්ඡේදය**

**ඇඹුම් සැරසිලිවල වාස්තු විද්‍යාත්මක ලක්ෂණ**

**දේශීය බලි සැරසිලි** - මැටි සපයා ගැනීම - බලි මැසි සැකසීම - බලි ඇඹීම - වර්ණ භාවිතය. නේත්‍රා තැබීම - බලි සිටුවීම - පාමුල් පේකඩ සැරසිලි - **තිර බලි හෙවත් කඩ බලි - වියත් හා පාවාඩ භාවිතය වෙනත් ඇඹුම්, කැටයම් හා චිත්‍රණය විධි - රඹ පතුරු භාවිතය - ගොප් කොළ කැටයම් - වෙස්මුහුණු කැටයම්.** 155 - 183

**සත් වෙනි පරිච්ඡේදය**

**ශාන්තිකර්මවල ඇතුලත් සෙසු වාස්තු විද්‍යාත්මක අනු අංග**

**රඟමඩල භාවිතය** - ගායනය හා බෙර වාදනය - **නර්තනය සඳහා රඟමඩල භාවිතය** - වෘත්තාකාර පසුබිමක නර්තනයේ යෙදීම - එක් දිශාවකට මුහුණ ලා නර්තනයේ යෙදීම - දෙ පසට සමාන්තර ව නර්තනයේ යෙදීම- සංකීර්ණ රංග රටා - හැඩතල හා හස්ත භාවිතය - **ආලෝකකරණය** - දුම්මල කීල භාවිතය - **පරිසරය සුවඳවත් කිරීම - පෙරදිග ඖෂධ වර්ග භාවිතය- පූජා විධි සඳහා භාවිත ආහාර පාන. ශුභා ශුභ අනාවැකි - වචනාර්ථ දක්වීම - ශාන්තිකර්ම ආශ්‍රිත ශුභාශුභ අනාවැකි - වාස්තු නිර්මාණ ආශ්‍රිත ශුභාශුභ විශ්වාස- වස් දොස් ඉවත් කිරීමේ චාරිත්‍ර වාරිත්‍ර- දිශා භාවිතය හා බැඳුණු ශුභාශුභ විශ්වාස - අංග ලක්ෂණ හා දේහ ලක්ෂණ විශ්වාස - සිහින පලාඵල විශ්වාස.** 184 - 218

**නිගමනය** 219 - 220

**උපග්‍රන්ථය** 221 - 246

**චිත්‍රාවලිය** 247 - 271

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය** 272 - 301

**වචන අනුක්‍රමණිකාව** 302 - 334

# හැඳින්වීම

ශ්‍රී ලාංකික ගැමි බෞද්ධයන්ගේ ආගමික, සාමාජික හා සංස්කෘතික ආදි ජීවිතයේ සෑම අංශයක් කෙරෙහි පෙරදිග වාස්තු විද්‍යාත්මක අංග අවියෝජනීයත්වයෙන් බද්ධ ව පවතී. ලෞකික දිවියේ දී තමන් වෙත බල පවත්වනු ලබන විවිධ දුක් කම්කටොලුවලින් මිදී යහපත් දිවියක් ගත කිරීම උදෙසා විවිධ වත්පිළිවෙත් හා පුද පූජා අන්තර්ගත පෙරදිග වාස්තු විද්‍යාත්මක අවස්ථා බෙහෙවින් දේශීය ශාන්තිකර්මවලට සමගාමී ව විද්‍යමාන වේ. මේ අනුව දේශීය ශාන්තිකර්ම හා පෙරදිග වාස්තු විද්‍යාත්මක අංග සිංහල ජන ජීවිතය කෙරෙහි බලපා ඇත.

සියලු කලාවන් ගෙන් පෝෂණය ලබන සියලු කලාවන් එක්රැස් කරන "කලාත්මක විද්‍යාව" වාස්තු විද්‍යාව යනුවෙන් හඳුන්වා තිබීමෙන් පැහැදිලි වන්නේ වාස්තු විද්‍යාව යනු ගෘහ නිර්මාණ ශිල්පය ම පමණක් නො වේ යන අදහස යි.[1] ශාන්තිකර්ම යනුවෙන් හඳුන්වන වත්පිළිවෙත් ක්ෂේත්‍රය විමසා බැලීමේ දී ඊට නර්තනය, ගායනය, වාදනය, චිත්‍ර, මූර්ති, කැටයම්, මෝස්තර ආදි සුවිශේෂී කලාංග රැසක් අන්තර්ගත ව ඇත. ඒවා ශාන්තිකර්ම පැවැත්වීම සඳහා අත්‍යවශ්‍ය අංගයන් ගෙන් කිහිපයකි. ඒ අතරින් චිත්‍ර මෝස්තර, කැටයම්, මූර්ති ආදි කලා කටයුතු ගෘහ නිර්මාණ ශිල්පයට යාවජීව ව පවත්නා වාස්තු විද්‍යාත්මක ශිල්ප ශාස්ත්‍ර බව කවුරුත් පිළිගනිති. නර්තනය ද වාස්තු විද්‍යාව හා බැඳුණු එ වැනි ශිල්පයක් බව "හැව්ලොක් එලිස්" සඳහන් කරයි.

> " නර්තනය හා ගෘහ නිර්මාණය යන දෙකම අත්‍යවශ්‍ය ප්‍රාථමික කලාවෝ ය. මිනිසා මානවයකු ලෙස තම අභ්‍යන්තරය ප්‍රකාශනය සඳහා උපකාරයට ගත් සම්පත්වලින් වැදගත් වන්නේ නර්තන කලාව යි. ගෘහ නිර්මාණය හෝ වාස්තු විද්‍යාව මිනිසා ගේ පිටත පවත්නා කලාවන්ගේ ආරම්භක ස්ථානය යි. අවසානයේ දී මේ දෙක ම එක් වෙයි. සංගීතය, නර්තනය, කාව්‍යය යන සියල්ල එක ප්‍රවාහයකි. මූර්ති කලාව, සිත්තර කලාව යන කලා, සැලසුම් කලාවේ අංග යි. මේ කලාවන් දෙකින් පිටස්තර ව ප්‍රාථමික කලාවක් නැත. මේවා මිනිස් ඉතිහාසයට වඩා පැරණි ය."[2]

---

1. **ජයලත් මනෝරත්න සමග පිළිසඳරක්,** කුමුදු රණවීර ආදි හු, **වාස්තු,** ප්‍රසන්න කුලතිලක (සං:), 2 වන කලාපය, වාස්තු විද්‍යා ග්‍රන්ථ ප්‍රකාශක මණ්ඩලය, ද ප්‍රින්ට් ෂොප්, කිරුළපන, 2001, 16 පිටුව.

2. **The Dance of Life,** Havelock Ellis, **What Is Dance?** Roger. Copeland and Marshall Cohen, (Ed.) Oxford University Press, New York, 1983, **( W. I. D. )** Pg. 478.

වාස්තු විද්‍යාව හා සෙසු කලාවන් එකිනෙක සම්බන්ධ වන අයුරු පැහැදිලි කෙරෙන පුවතක් පවතී.[1] ප්‍රවීණ කලා ශිල්පියකුගෙන් අසන්නට ලැබුණු එය ග්‍රන්ථාගත ව සොයා ගැනීමට අපහසු වුවත්, එපුවත මෙහි ලා සඳහන් කිරීම වැදගත් යැයි හැඟේ.

සියලු කලාවන්හි දී ම ඒක රාශී වීම නොහොත් වාස්තු විද්‍යාත්මක ගුණාංග ඇතුළත් ව ඇති අයුරු ඉහත තොරතුරුවලින් ගම්‍ය කරවයි. ඒ අනුව සියලු කලාවන්ගේ ආරම්භය වාස්තු විද්‍යාවට ඇතුළත් කෙරෙන අතර එය නිර්මාණකරුගේ චින්තනය මත ආභ්‍යන්තරිකව ගොඩ නැගී, අවසානයේ එහි ප්‍රතිඵලය බාහිර වශයෙන් භෞතික ව යෙදෙනු දක්නට ඇත. එය සියලු කලාවන්හි ගොඩ නැගීම හෙවත් නිර්මාණයේ දී කලාකරුවා සතු අවකාශය උපරිම අයුරින් භාවිත කිරීම මූලික ලක්ෂණයකි. ඊට අවශ්‍ය ශක්තිමත් අත්තිවාරම ඔහු සතු දැනුම හා අවබෝධය යි. කිසියම් කලා ශිල්පයක මූලික ශිල්ප ශාස්ත්‍ර නිරතුරු ව ප්‍රගුණ කිරීමෙන් ඒ ඒ විෂයානුබද්ධ ව ලබා ගන්නා මූලික දැනුම හා අවබෝධය අදාළ නිර්මාණයේ අලංකරණයට මෙන් ම අවසාන ප්‍රතිඵලය කෙරෙහි ද බල පවත්වනු ඇත. ඒ අනුව නිර්මාණය කළ අයුරු අගයමින් පුන පුනා රසවිඳිය හැකි විෂය ධාරාවක් වාස්තු ශිල්පයට ඇතුළත් වෙයි. එය ලෝකයේ ජීවත්වන සියලු මානව වර්ගයන් අතර ප්‍රචලිත ඉතා පුළුල් විෂය ක්ෂේත්‍රයකි. පෙර අපර දෙ දිග වශයෙන් සලකා බලන විට ශ්‍රී ලාංකිකයන් අතර අතීතයේ සිට වර්තමානය දක්වා වඩාත් ප්‍රබල ලෙස භාවිතයට පත් ව ඇත්තේ පෙරදිග වාස්තු විද්‍යාව යි. එය අවශ්‍ය පරිසරය සැලසුම්කරණයට ඉතා වැදගත් ශිල්ප ශාස්ත්‍රයකි.

---

1. "වාස්තු ශිල්පයට ඇලුම් කළ එක්තරා ශිෂ්‍යයෙක් විය. ඔහු වාස්තු ශිල්පය පිළිබඳ ප්‍රවීණ ගුරුවරයකු වෙත ගොස් තම අදහස් පැවැසීය. ගුරුවරයා ඔහු අමතා වාස්තු ශිල්පය හැදෑරීමට අපේක්ෂා කෙරේනම් ඊට ප්‍රථම මූර්ති ශිල්පය ප්‍රගුණ කළයුතු බව පැහැදිලි කර දෙන්නට විය. ඒ අනුව ශිෂ්‍යයා ප්‍රවීණ මූර්ති ශිල්පියෙක් හමු ව තම අවශ්‍යතාව කී ය. කරුණු හොඳින් අසා සිටි මූර්ති ශිල්ප ගුරුවරයා ඔහුට මූර්ති ශිල්පය හැදෑරීමට පෙර ආලෝකය අඳුර දැක්වීම හා විවිධ වර්ණ භාවිතයෙන් චිත්‍ර ඇඳීමට අවශ්‍ය හැකියාව ලබා ගැනීම වැදගත් වන බව තේරුම් කර දුනි. අනතුරු ව ශිෂ්‍යයා චිත්‍ර ශිල්ප ගුරුවරයෙක් හමුවන්නට විය. එහි දී චිත්‍ර කර්මය පිළිබඳ බහුශ්‍රැත ගුරුවරයා මිනිස් සිරුරේ චලන, රිද්මය, හැඩතල පිළිබඳ අවබෝධය ලබා ගැනීම පිණිස නර්තනය හැදෑරිය යුතු බව පැවසීය. අපේක්ෂිත අරමුණ ඉටු කර ගැනීම් වස් ප්‍රවීණ නර්තන ශිල්පයෙකු හමු වූ ශිෂ්‍යයාට නර්තනය ඉගෙනීමට නම් ඊට පෙරාතුව තාල, රිද්ම, ගායන, වාදන පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම උදෙසා සංගීතය හැදෑරීම අවශ්‍ය බව පැහැදිලි කර දීමට නර්තන ගුරුවරයාට සිදු විය. ශිෂ්‍යයා සංගීත ගුරුවරයෙකු හමුවට යාමෙන් අනතුරු ව ඔහුට අසන්ට ලැබුණේ සංගීතය හැදෑරීමට පෙර ස්වාභාවික පරිසරයට අදාළ ගස් වැල් සුලඟට සෙලවීම හා ඇල දොළ ගංගා දියඇලි ගලා යාම ආදි අජීවි සම්පත්වල නාද මෙන් ම කෘමින් සතුන් හා පක්ෂීන් ගේ සජීවි නාද හොඳින් ශ්‍රවණය කිරීමෙන් සහ රස විඳීමෙන් පරිසරය හොඳින් අධ්‍යයන කළයුතු බවකි. සියලු ශිල්ප ප්‍රගුණ කළ ශිෂ්‍යයා අවසානයේ වාස්තු ශිල්පය හදාරන්නට වීලු."

සට: ප්‍රවීණ චිත්‍ර ශිල්පී **සෝමබන්දු විද්‍යාපති** කලාගුරින් සමඟ 2002.10.28 දින රවිබන්දු විද්‍යාපති මහතාගේ නිවසෙහි පවත්වන්නට යෙදුනු සම්මුඛ සාකච්ඡාවෙන් මෙම පුවත අසන්නට ලැබිණ.

සිංහල ගැමි ශාන්තිකර්ම හා වාස්තු විද්‍යාත්මක අංග අතර සම්බන්ධය කවදා කවරකු විසින් කිනම් ස්ථානයක දී ආරම්භ කරන ලද්දක් දැයි නිශ්චිත ව පැවැසිය නො හැකි ය. එහෙත් ඒවා කලාන්තරයක් තිස්සේ අසල්වැසි ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පැවති ආගමික සංස්කෘතික හා සමාජ සම්බන්ධතා මත වරින් වර දේශීයකරණයට පත් වන්නට විය. එ වැනි විවිධ ඇදහිලි විශ්වාස මෙ රට ස්ථාපිත ව තිබීමෙන් ඒවායේ සම්භවය භාරතය නො වේ දැයි කිසියම් අදහසක් ගොඩ නැගීම කෙනකුට අසීරු නො වේ. ශ්‍රී මහා බෝධිය මෙ රටට වැඩම කිරීමේ දී පැමිණි අටළොස් කුලයක ශිල්පීන්[1] පිළිබඳ තොරතුරු ද, වරින් වර මෙ රට සිදු වූ ආක්‍රමණය හා සංක්‍රමණවලින් ද, විශේෂයෙන් ජනශ්‍රැතියේ සඳහන් ඉන්දියානු බමුණන් ගේ යාග ක්‍රම ආදි තොරතුරුවලින් ද ඊට අවශ්‍ය පසුබිම අපට සපයා දෙයි. ඒ අතර අතීතයේ මෙ රට පැමිණි, සොලී හා මලල කුමාරවරුන් විසින් විවිධ යක්‍ෂ දේව ඇදහිලි මෙ රට ස්ථාපිත කරවීම,[2] ගජබා රජුන් ගේ සොලී ආක්‍රමණය හා පත්තිනි ඇදහිල්ල මෙ රටට ගෙන ඒම[3] ආදි තොරතුරු රැසක් මූලාශ්‍රය වශයෙන් පවතී. එකී ඇදහිලි විශ්වාස මුල් කොට පැවැති යාග හෝම වත්මනෙහි පවත්නා ශාන්තිකර්ම පද්ධතියට මූලික වුවත්, අද දක්නට ඇති සිංහල ශාන්තිකර්ම බොහොමයක් කෝට්ටේ යුගයෙන් පසු මෙ රට ස්ථාපිත වූවක් බව පිළිගැනේ.[4] නිදසුනක් වශයෙන් බමුණන් විසින් මුල් යුගයේ මෙ රට පවත්වන ලද බලි යාග බෞද්ධ මුහුණුවරකින් සිංහල ජනයා අතට පත් කිරීමේ සංසිද්ධියට ඇප කැපවීම උදෙසා වීදාගම මා හිමියන් ඇතුළු යතිවරයන් රැසක් ඉටු කළ මෙහෙය ඉතා අගනේ ය.[5] ඒ හැරුණු විට මහනුවර යුගයේ මෙ රට විසූ ගණිතන්නාන්සේලා හා යක්දෙස්සලා විසින් රචනා කරන ලද යාග කවි රැසක් වත්මන් ශාන්තිකර්ම පැවැත්වීමේ දී ද භාවිත කෙරේ. ඒ ඒ ශාන්තිකර්ම පැවැත්විය යුතු ආකාරය අදාළ සැරසිලි හා පුද පූජා පිළිවෙළෙහි විස්තර ඇතුළත් ඒවා පාරම්පරික ව අත් පිටපත් හා පුස්කොළ පිටපත් වශයෙන් ද වන පොත් කිරීමෙන් ද දැනුදු පවතී.[6]

---

1. **සිංහල බෝධිවංශය,** ප්‍රඥාසේකර හිමි (සංස්), විද්‍යාර්ථ ප්‍රකාශන යන්ත්‍රාලය, 1928, (කෙටි කිරීම **සිං. බෝ. ව.**) 70-72 පිටු.
2. වාචිස්සර හිමි, කොටගම, **සරණංකර සංඝරාජ සමය,** වයි. දොන් ඇඩ්වින් සහ සමාගම, ස්වීය මුද්‍රණාලය, කොළඹ, 1960, (කෙටි කිරීම **ස. සං. ස.**) 31 පිටුව.
3. **රාජාවලිය,** ඒ. වී. සුරවීර (සංස්), ලේක්හවුස් ඉන්වෙස්ට්මන් සමාගම, කොළඹ, 1976, (කෙටි කිරීම **රා. ජා. ව.**) 187 පිටුව.
4. (අ) දිසානායක, මුදියන්සේ, **කොහොඹා යක් කංකාරිය සහ සමාජය,** ශීලා ප්‍රින්ටින් වර්ක්ස්, කැලණිය, 1988, (කෙටි කිරීම **කො.කං.ස.**) 20 පිටුව.

   (ආ) බෙන්තරගේ, ලයනල්, **කළුකුමාර යාග පිළිවෙළ,** එස් ඇන්ඩ් එස් ප්‍රින්ටර්ස්, දෙමටගොඩ, 1998, (කෙටි කිරීම **ක.යා.පි.**) 39 පිටුව.
5. කාරියවසම්, තිස්ස, **බලියාග පිළිවෙළ,** පළමු වැනි මුද්‍රණය, සමයවර්ධන මුද්‍රණාලය, කොළඹ, 1986, (කෙටි කිරීම **බ. යා. පි.**) 19, 20 පිටු.
6. **සට:** මේ පිළිබඳ තොරතුරු බිඳක් මූලාශ්‍රය හැඳින්වීම යටතේ විස්තර කෙරේ.

සිංහල ශාන්තිකර්ම පිළිබඳ ගොඩ නැඟී ඇති මෙ පුවත් හා සම කළ හැකි තත්ත්වයක් දේශීය වාස්තු විද්‍යා ශිල්ප ශාස්ත්‍ර සම්බන්ධයෙන් ද ගොඩ නගා ගත හැකි ය. මුල් කාලයේ වාස්තු විද්‍යාව සම්බන්ධ විවිධ ශිල්ප ශාස්ත්‍ර ග්‍රන්ථ ලාංකිකයන් අතර දුර්ලභ වුව ද, විවිධ ශ්‍රේණිවලට අයත් කාර්මික ශිල්පීන් අතර වාස්තු විද්‍යාත්මක දැනුම අවබෝධය පුළුල් ව තිබුණ බව අතීතයේ පටන් මෙ රට දක්නට තිබූ රාජධානිවලින් හමු වන නටබුන් මගින් ගම්‍ය කෙරේ. එකල විසූ ප්‍රවීණ ආචාර්යවරුන් අතර ඒ ඒ ශිල්පවලට අයත් ඥානය අත් පොත් වශයෙන් හා වන පොත් කිරීමෙන් පවතින්නට ඇත. පශ්චාත්කාලීන ව පොළොන්නරු යුගයේ රචිත යැයි සැලකෙන දෛවඥකාමධෙනු[1] වැනි සංස්කෘත භාෂාවෙන් රචිත ග්‍රන්ථ ඒ අතරට මූලාශ්‍රයය කෘතියක් වශයෙන් හමු වේ. අනතුරු ව වාස්තු විද්‍යාත්මක ග්‍රන්ථ රචනාකරණය පිළිබඳ තොරතුරු දක්නට නැතත්, ඉන් අදහස් කෙරෙනුයේ එම ග්‍රන්ථයට පෙර හෝ පසුකාලයේ හෝ මෙ රට විසූ වාස්තු විද්‍යාත්මක නිර්මාණ ශිල්පීන් ඒ සම්බන්ධ නිර්මාණකරණයෙහි නො යෙදුණු බව නො වේ. ඔවුන් විසින් ඉදි කරන ලද වාස්තු විද්‍යා නිර්මාණ රැසක් පිළිබඳ තොරතුරු මහාවංසය වැනි වංස කථා හා පුරාවිද්‍යාත්මක නටබුන් මගින් අවබෝධ කර ගත හැකි ය.[2]

ශාන්තිකර්ම පැවැත්වීමට මෙන් ම වාස්තු විද්‍යාවට අදාළ විවිධ කලා ශිල්පවලට අයත් පාරම්පරික වෘත්තිකයෝ අතීතයේ පටන් මෙ රට සිටිය හ. ඒ අතර තඹ, ලෝකඩ, පිත්තල, රන්, රිදී ආදි ලෝහමය වාත්තු නිර්මාණ කැටයම්කරුවන් ද ගල්, දැව ආදි වෙනත් ද්‍රව්‍යවලින් පිළිම නිර්මාණ කළ පිරිස් ද, සිත්තරුන් ද ආදි වශයෙන් විවිධ ශිල්පීහු මෙ රට ජීවත් වූහ.

වෛදික යුගයේ පටන් වසර දහස් ගණනක් තිස්සේ මිනිසාගේ පැවැත්ම උදෙසා විවිධ වත්පිළිවෙත් සහිත පැවැත ආ මේ ශිල්ප ක්‍රම දෙකෙහි ඓතිහාසික පසුබිම පිළිබඳ යම් බඳු තොරතුරු දක්නට ඇත ත්, බටහිර ජාතීන් අතර මධ්‍යතන යුගයේ ඇරඹුණු විද්‍යා පුනර්ජීවයේ ප්‍රතිඵලය අනුව සාම්ප්‍රදායික හා ගතානුගතික චින්තන ක්‍රමයට එරෙහි ව ප්‍රතිසංස්කරණවාදී අදහස් පෙර දැරි කර ගත් නව විද්‍යාත්මක චින්තන බිහි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලෝක නිර්මාණවාදය හා සම්බන්ධ දේව විශ්වාස, ප්‍රාථමික ගණයේ ලා සම්බන්ධ වෙනත් විශ්වාස නව විද්‍යාත්මක චින්තනය ඔස්සේ නිෂ්ප්‍රභවන්නට විය. ඒ අතර සමාජ, මානව, මනෝ, පුරා විද්‍යා වැනි විවිධ විද්‍යා විෂයන්ට අනුව පර්යේෂණ ක්‍රියාවලියට නතු ව අධ්‍යයන කිරීමට

1. **දෛවඥකාමධෙනු,** ඩී. ආර්. සෙනෙවිරත්න (සංස්), මොඩන් පොත් සමාගම, මොඩන් ස්වීය මුද්‍රණාලය, නුගේගොඩ, 1989, (කෙටි කිරීම **දෛ. කා.**) සංඥාපනය iii පිටුව.

2. **සට:** ඒ ඒ රාජ්‍ය චකවානුවල දී නිර්මාණය කරන ලද ආරාම, වෙහෙර, විහාර, පිළිම, දාගැබ්, පොකුණු, රජ මාළිගා, නගර, ග්‍රාම, උද්‍යාන නිර්මාණ, මංමාවත් හා විවිධ තරාතිරමේ ගෘහ නිර්මාණවලින් ඒ බව පසක් කෙරේ.

මං පෙත් විවර කෙරිණ. එහි මහඟු ප්‍රතිඵල වශයෙන් විවිධ පර්යේෂණාත්මක ග්‍රන්ථ හා ලිපි ලේඛන රැසක් මුද්‍රණද්වාරයෙන් එළිදක්වෙන්නට විය. නව චින්තනය ඔස්සේ මෙම ක්‍රියාවලියෙහි ලා දෙස් විදෙස් වියතුන් විසින් සිංහල කලා ශිල්ප, වත්පිළිවෙත් හා ශාන්තිකර්ම පිළිබඳ ඉදිරිපත් කරන ලද පර්යේෂණ රාශියකි.[1]

දේශීය ශාන්තිකර්ම හා වාස්තු විද්‍යාව සම්බන්ධයෙන් වෙන් වශයෙන් විවිධ ලිපි ලේඛන හා ග්‍රන්ථ රැසක් දක්නට ඇත ත්, සිංහල ශාන්තිකර්ම ආශ්‍රිත වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ පිළිබඳ විග්‍රහයකට ලක් කෙරෙන කිසිදු අවස්ථාවක් මේ තාක් අපට හමු වී නො මැත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ගාලු දිස්ත්‍රික්කයේ පවත්නා ශාන්තිකර්මවල අන්තර්ගත වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කිරීම කාලෝචිත ය.

විවිධ විද්වතුන් විසින් ශාන්තිකර්ම හා වාස්තු විද්‍යාව සම්බන්ධයෙන් දක්වා ඇති තොරතුරු විශ්ලේෂණයේ දී පැහැදිලි වන ඉතා වැදගත් කරුණක් වන්නේ උභය ක්‍ෂෙත්‍රයන්හි දක්නට ඇති සියුම් සම්බන්ධය හඳුනා ගැනීමට හුදු ශාස්ත්‍රීය අවබෝධය පමණක් ම තිබීම ප්‍රමාණවත් නො වන බව යි. ඒ සඳහා ගැමි ඇදහිලි සිතුම් පැතුම් හා ගැමි සහජීවනය පිළිබඳ පුළුල් අධ්‍යයනයක් කිරීම අත්‍යවශ්‍ය අංගයක් බව පසක් කර ගැනීම අප ලත් භාග්‍යයකි. එ මගින් ගැමි ශාන්තිකර්ම සඳහා යොදා ගන්නා මඩු, සැරසිලි නිර්මාණවල පුද පූජා රැසක් පෙරදිග වාස්තු විද්‍යාවේ ඇතුළත් ඇතැම් අංග හා සැසඳිය හැකි බව පැහැදිලි විය.

සුඛිත මුදිත ජීවිතයක් ගත කිරීම උදෙසාත්, ශාරීරික, මානසික සංතුෂ්ටිය ළඟා කර ගැනීම සඳහාත් යහපත් ජීවන පරිසරය මෙන් ම නිදුක් නිරෝගී සැපත ද අවශ්‍යය වන්නේ ය. ඒ සඳහා ජීවත් වීමට අවශ්‍ය කෙරෙන වාසස්ථාන, ග්‍රාම, නගර, උද්‍යාන, පොකුණු, මංමාවත් නිසි පරිදි නිර්මාණ කිරීමට සුවිශේෂ සැලකිල්ලක් දැක්වූහ. ඒවා නිර්මාණයේ නියුක්ත ශිල්පීන්ට ද සෙසු ජනයාට ද යහපතක් ඉටු කිරීම අභිප්‍රේත එක් අරමුණකි. එය සාක්ෂාත් කර ගැනීම උදෙසා ශුභ නිමිති හා නක්‍ෂත්‍රය අනුව කටයුතු කිරීම, විපත් දුරු කරවා ගැනීම පිණිස විවිධ පුද පූජා පැවැත්වීම ආදි වශයෙන් පවත්නා විශේෂ චාරිත්‍ර විධි බොහෝ ය. එ වැනි චාරිත්‍ර වාරිත්‍ර සඳහා මුල් වන දෙවි දේවතාවෝ ද, යක්‍ෂයෝ ද ගැමි ශාන්තිකර්මවලට ඉතා දැඩි ව සම්බන්ධ වූවෝ වෙති. විශේෂයෙන් වාස්තු විද්‍යාවට හා අනෙකුත් සියලු ඉදිකිරීම්වලට මුල් වන දෙවියා වශයෙන් සැලකෙන විශ්වකර්ම නොහොත් "විස්කම්" බලියාගවල දී මූර්තිමත් කොට පූජ්‍යත්වයට පත් කොට තිබීම එක් නිදසුනකි. තවද සතරවරම් දෙවිවරු, නව ග්‍රහයන්, ප්‍රාදේශීය දෙවිවරු, මිහිකත මෙන් ම අට කොණ, ගංගා, ළිං, පොකුණු, පරුවත, ගිරි ශිඛර ආදි ස්ථානයන්ට අරක් ගන්නා සියලු දෙවි දේවතාවන් ද,

1. සට: පළමු වන පරිච්ඡේදයෙහි දී මේ පිළිබඳ කෙටි ඇගැයීමක් දක්වා ඇත.

බහිරවයන් පිළිබඳ ගොඩ නැඟුණු ඇදහිලි හා විශ්වාස ද වාස්තු විද්‍යාත්මක කටයුතුවල දී මෙන් ම ශාන්තිකර්මවලට ද සම්බන්ධ කොට ඇත.

ගාලු දිස්ත්‍රික්කයේ පවත්නා ශාන්තිකර්ම අතරින් පුරා තිස් පැයක් හෝ ඊට වැඩි කාලයක් ගත කොට පවත්වනු ලබන ශාන්තිකර්ම මෙම අධ්‍යයනයෙහි ලා තෝරා ගැනිණ. ඒ අතර සන්නි යකුම හෙවත් දහඅට සන්නිය, රටයකුම හෙවත් රිද්දි යාගය, සූනියම් කැපීමේ ශාන්තිකර්මය, මහසොහොන් සමයම ආදි යක් තොවිල් ද, මඩු තෝත්‍ර ගණයේ ලා සැලකෙන ගම්මඩු, දෙවොල් මඩු, කෝල්මුර යාගය වැනි දේව ශාන්තිකර්ම ද, බලි යාග ආදි ග්‍රහ ශාන්තිකර්ම කෙරෙහි මෙහි ලා විශේෂ අවධානයට ලක් කෙරේ. එම ක්‍රියාවලියේ දී ශාන්තිකර්ම පැවැත්වීම සඳහා නිර්මාණය කෙරෙන රහමඬලු සැරසිලි, පූජා වස්තු හා රංග භාණ්ඩ නිර්මාණය කිරීම මෙන් ම, ඒ ඒ යාගවලට ආවේණික සිරිත් විරිත්, ගති පැවැතුම් හා කළයුතු/නො කළයුතු පිළිවෙත් ආදි වශයෙන් ගැමි සාරධර්ම රැසක් අන්තර්ගත ව ඇත. ඒවා රෝගියා සුවපත් කර ගැනීමේ මුඛ්‍ය පරමාර්ථය ඉටු කර ගැනීම වස්, භාවිත අභිප්‍රේරණ කාර්යයෝ වෙති.

දේශීය ශාන්තිකර්ම පිළිබඳ සියලු තොරතුරු ඇතුළත් වනුයේ ඒ ඒ යාගයට අදාළ යාග ගී/කවි හෙවත් ශාන්තිකර්ම සාහිත්‍යයෙහි ය. දීර්ඝකාලීන ව වන පොත් කිරීමෙන් පැවැති ඒවායේ අදාළ මිනුම් හා ප්‍රමාණයන්හි යම් බඳු වෙනස්කම් ද දක්නට ඇත. ඒ හැරුණු විට ඒ ඒ ශාන්තිකර්ම ශිල්පියාගේ නිර්මාණ කුසලතා මත ඒවායේ ගුණාංග ද අඩු වැඩි වෙමින් පවතී. එහි දී ශාන්තිකර්මයට සහභාගී වන ශිල්පීන්ගේ ප්‍රමාණය අනුව රහමඬල පරිමාණ ද වෙනස් කිරීමට කටයුතු කෙරේ.

මෙ වැනි විවිධ හේතුන් හා ශාන්තිකර්ම ශිල්පීන් අතින් සිදු වන අඩු පාඩු, අත පසුවීම් මත ඇතැම් විට ඔවුනට රිසි සේ හුරු පුරුදු අයුරින් සරල ව ඒ ඒ යාගවලට අයත් නිර්මාණ ඉදිකිරීම්වල නිරත වන බව පෙනේ. එ බැවින් ශාන්තිකර්ම ශිල්පීන් විසින් නිර්මාණය කරනු ලබන එකී සැරසිලි රංගන හා පූජා වස්තුවල ඒකාග්‍රතාවක් දක්නට නො මැත. එබැවින් මෙ වැනි අධ්‍යයනයක දී ඉටු කළ හැකි මෙහෙය ඉතා සුපරීක්ෂාකාරී වීම අනිවාර්ය වේ.

ශ්‍රී ලාංකික සිංහල ගැමි බෞද්ධයන් අතර පවත්නා ශාන්තිකර්ම උඩරට, පහතරට, සබරගමු ආදි වශයෙන් දිවයින පුරා විවිධ ප්‍රදේශයන්හි දක්නට ඇත. ඒ අතර පහතරට යැයි සම්මත දකුණු හා බස්නාහිර පළාත් ආශ්‍රිත ව ව්‍යාප්ත ව පවත්නා නැටුම්/රංග ශෛලිය පහතරට නැටුම් හෙවත් රුහුණු නැටුම්

යනුවෙන් හැඳින් වේ. එය නගර ග්‍රාම මුල් කොට මාතර, බෙන්තර, රයිගම යනුවෙන් ප්‍රධාන ගුරුකුල තුනක් යටතේ විද්‍යමාන වේ. පහතරට බෙරය හෙවත් රුහුණු බෙරය ප්‍රධාන වාද්‍ය භාණ්ඩය යි. තත් ප්‍රදේශය පුරා පවත්නා ශාන්තිකර්මවල දී ඔවුනොවුනට ආවේණික ගායන හා නාද මාලාවලින් ද අනූන ය. රංග භූමි සැරසිලිද, රංගනයේ දී රහමඬල අවකාශය සපිරීම සඳහා ඔවුනොවුන්ට ආවේණික රංග රටා ද බහුල ය. මේ අතරින් අප අධ්‍යයනයට තෝරා ගත් ගාලු දිස්ත්‍රික්කය වූකලි බෙන්තර, රයිගම හා මාතර ගුරුකුලවලට අයත් ශාන්තිකර්ම ශිල්පීන්ගේ දායකත්වය මැනවින් දෘශ්‍යමාන වන දකුණු පළාතට අයත් එක් කොටසකි. ගාලු දිස්ත්‍රික්කයට අයත් දකුණු භූමි ප්‍රදේශයේ දී මාතර ගුරුකුලයේ ශාන්තිකර්ම රැසක් ද උතුරු භූමි ප්‍රදේශයට අයත් බෙන්තර පුරවරය ආශ්‍රිත ප්‍රදේශයන්හි දී රයිගම ගුරුකුලයට අයත් ශිල්පීන්ගේ මඩු ශාන්තිකර්ම ද බෙන්තර ගුරුකුලයේ යක් තොවිල් හා බලි ශාන්තිකර්ම ද ව්‍යාප්ත ව පවතී. ඒ අතර මාතර හා බෙන්තර ගුරුකුලය සම්මිශ්‍රණයෙන් ගොඩ නැගුණු අනු ගුරුකුලයකට අයත් ශාන්තිකර්ම ශිල්පීහු රැසක් ගාලු දිස්ත්‍රික්කයේ මැද කොටසට හා නැගෙනහිර ප්‍රදේශයට අයත් ගම් දනව්වල වෙසෙති. මේ කරුණු සලකා බලන විට ගාලු දිස්ත්‍රික්කය පහතරට නර්තනයේ ප්‍රධාන ගුරුකුල තුනත් හා ඒවායේ සම්මිශ්‍රණයෙන් ගොඩ නැගී ඇති අනු ගුරුකුලයක් ද, ගාලු දිස්ත්‍රික්කයේ පවතී.

පූර්වෝක්ත ශාන්තිකර්ම ශිල්පීන් විසින් ඒ ඒ ශාන්තිකර්ම පැවැත්වීමේ දී යොදා ගන්නා රහමඬලු සැරසිලි නිර්මාණයන්හි සුවිශේෂතා දක්නට ලැබේ. දිවයිනේ වෙනත් පළාත්හි පවත්නා ශාන්තිකර්ම හා සසඳන විට ගාලු දිස්ත්‍රික්කය පුරා පවත්නා ශාන්තිකර්මවල වඩා නෙත්කළු අලංකාර සැරසිලි මෝස්තර රටා බහුල ව දක්නට ඇත. එ පමණක් නො ව එකිනෙකට වෙනස් ශාන්තිකර්ම රැසක් ද, සුවිශේෂ ඇඳුම් පැළඳුම් හා ප්‍රායෝගික උපක්‍රම රැසක් ද හමුවන්නේ ගාලු දිස්ත්‍රික්කයෙහි ශාන්තිකර්මවල දී පමණි.

පාරම්පරික ව පවත්නා මේ විශේෂතා ඒ ඒ ගුරුකුලවලට ආවේණික වීමට හේතු භූත වූ කරුණු ද, ඒ ඒ නිර්මාණවලට පාදක ව පවත්නා වාස්තු විද්‍යාත්මක ලක්ෂණ ද විමසා බැලීමේ කුතුහලය අප තුළ ජනිතවීමට හේතු වූ තවත් වැදගත් කරුණක් වන්නේ ශාන්තිකර්ම ශිල්පියෙකු ලෙස කටයුතු කිරීමෙන් ලද අත්දැකීම් තව දුරටත් විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමේ අභිලාසය යි. ඒ සඳහා ගාලු දිස්ත්‍රික්කයේ ශාන්තිකර්මවලින් පිළිබිඹු කෙරෙන වාස්තු විද්‍යාත්මක ලක්ෂණ යන මැයෙන් තොරතුරු විශ්ලේෂණ කිරීමේ දී ඒ ඒ ශාන්තිකර්මවලට අයත් වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පෙරදිග වාස්තු විද්‍යාව හා සැසැඳීම, උභය විෂයක්ෂේත්‍රවල පුද පූජා සහ ඒවාට පාදක වන ඇදහිලි විශ්වාස විමසා බැලීම, ශාන්තිකර්ම ශිල්පියාගේ හා පෙරදිග. වාස්තු විද්‍යා නිර්මාණ ශිල්පියාගේ සබඳතා විමසීම, භාවිත කෙරෙන මිනුම් ක්‍රම හා

නිර්මාණකරණයේ යොදා ගන්නා උපක්‍රමවල දක්නට ඇති විශේෂතා ඇගැයීම ආදි කරුණු සාකච්ඡා කිරීම මෙම අධ්‍යයනයෙහි ලා වැදගත් කොට සැලකිණ. එයින් මිනිසාගේ පැවැත්මට අවශ්‍ය කෙරෙන නිදුක් නිරෝගී භාවය හා අනිකුත් ක්‍රියාවලීන් සපුරා ගැනීම සඳහා යොදා ගන්නා ශාන්තිකර්ම පිළිබඳ වත්, මිනිසා ගේ ජීවත්වීමේ මූලික අපේක්ෂාවන්ට ඇතුළත් වන මෙ ලොව, සැප සම්පත්, ආස්වාදය හා වාසනාව ලබා ගැනීම උදෙසා ක්‍රියාත්මක විද්‍යාවක් ලෙස ගැනෙන වාස්තු විද්‍යාත්මක අංග ශාන්තිකර්ම තුළ අන්තර්ගත වන අයුරු විමර්ශනය කිරීමත් මෙම අධ්‍යයනයෙහි ලා අපේක්ෂිත ය.

# අන්තර්ගතය

මෙම නිබන්ධයෙහි ආරම්භයේ ඇතුළත් ප්‍රවේශයෙන් එහි අරමුණු, විෂය ක්ෂේත්‍රය, විෂය කාල පරිමාණය හා ක්‍රමවේදය යන කරුණු සාකච්ඡා කෙරිණි.

පළමු වෙනි පරිච්ඡේදය වෙන් කළේ මෙම නිබන්ධය සම්පාදනය කිරීමේ දී උපයෝගී කර ගන්නා ලද මූලාශ්‍රයය ග්‍රන්ථ හඳුන්වාදීම හා ඇගැයීම සඳහා ය. එහි දී උපකාර වූ ඓතිහාසික සහ සාහිත්‍යයික මූලාශ්‍රයය කෘතීන් අතරින් කිහිපයක විස්තර ඉදිරිපත් කර ඇත. ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය වශයෙන් යොදා ගත් එකී ලිඛිත මූලාශ්‍රයයට අමතර ව අලිඛිත මූලාශ්‍රයය යටතේ ගැනෙන ක්ෂේත්‍ර අධ්‍යයනයට අයත් තොරතුරු සඳහන් කෙරිණ. එහි දී නරඹන ලද ශාන්තිකර්ම ද, පවත්වන ලද සම්මුඛ සාකච්ඡා පිළිබඳ තොරතුරු ද එහි ඇතුළත් වේ.

දෙ වෙනි පරිච්ඡේදය ගාලු දිස්ත්‍රික්කයේ ශාන්තිකර්ම නමින් හැඳින්වේ. එහි ලා ගාලු දිස්ත්‍රික්කයේ පිහිටීම ජන ජීවිතය හා සම්බන්ධ විවිධ කලා ශ්‍රේණි සහ ජන ඇදහිලි විශේෂයක් ලෙස පවත්නා ශාන්තිකර්ම පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කෙරේ.

තෙ වෙනි පරිච්ඡේදය වෙන් කොට ඇත්තේ දේශීය වාස්තු විද්‍යාව හා අද්‍යතන ශාන්තිකර්ම පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කිරීම සඳහා ය. එහි දී දේශීය වාස්තු විද්‍යාව හඳුන්වා එහි ඓතිහාසික පසුබිමත්, දේශීය වාස්තු විද්‍යාත්මක කෘති හා ශාන්තිකර්ම අතර සබඳතා පැහැදිලි කෙරේ.

සතර වෙනි පරිච්ඡේදයෙන් ඒ ඒ ශාන්තිකර්ම සඳහා නිර්මාණය කෙරෙන රහමඬුලු සැරසිලි හැඳින්වේ. යහන්, මඩු නිර්මාණය, වීදි සැරසිලි හා තොරණ සැරසිලි වෙන් වශයෙන් පැහැදිලි කොට ඒවායේ ඇතුළත් වාස්තු විද්‍යාත්මක අංග පෙරදිග වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හා සංසන්දනය කෙරේ.

පස් වෙනි පරිච්ඡේදය වෙන් කරනු ලැබුයේ ගාලු දිස්ත්‍රික්කයේ ශාන්තිකර්මවල දී යොදා ගන්නා පූජා භාණ්ඩ, රංග භාණ්ඩ හා පලඳනා විශේෂ නිර්මාණය කෙරෙන ආකාරය සහ ඒවායේ අන්තර්ගත වාස්තු විද්‍යාත්මක ලක්ෂණ සාකච්ඡා කිරීම උදෙසා ය.

ගාලු දිස්ත්‍රික්කයේ ශාන්තිකර්මවල දී භාවිත කෙරෙන ඇඹුම් සැරසිලිවල ඇතුළත් වාස්තු විද්‍යාත්මක ගුණාංග විග්‍රහයක් සය වෙනි පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරෙන අතර එහි දී මෙ රට පිළිම ඇඹීම සම්බන්ධ චාරිත්‍රවත්පිළිවෙත් හා භාවිත උපක්‍රම විග්‍රහයට ලක් කෙරේ. ශාන්තිකර්ම රහමඬල තුළ විද්‍යමාන වාස්තු විද්‍යාත්මක අනු අංග සත් වෙනි පරිච්ඡේදයෙන් විමසුමට ලක් කළ අතර ශාන්තිකර්ම හා පෙරදිග වාස්තු විද්‍යා නිර්මාණවල භාවිත ශුභාශුභ නැකත් හා නිමිති ඇතුළු මිනිස් වාසයට උචිත පරිසරගත සිතුම් පැතුම් පිළිබඳ විග්‍රහයක් ද ඊට එක් වෙයි.

# සංක්ෂේපණය

| | | |
|---|---|---|
| අපේ. සං. | - | අපේ සංස්කෘතිය. |
| අ. සං. උ. | - | අපේ සංස්කෘතික උරුමය. |
| අසිරි. ඉ. | - | අසිරිමත් ඉන්දියාව. |
| ඉ. ශ්‍රී. ක. | - | ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ කලා ශිල්ප. |
| ඌ. පූ. ම. | - | ඌනපූරණසහිතො මහා වංසො. |
| ක. යා. පි. | - | කළුකුමාර යාග පිළිවෙළ. |
| ක. ශි. ශා. | - | කලාව සහ ශිල්ප ශාස්ත්‍ර. |
| කො. කං. ස. | - | කොහොඹා යක් කංකාරිය සහ සමාජය |
| ග. ම. පු. | - | ගම්මඩු පුරාණය. |
| ගා. ග්‍රා. එ. | - | ගාල්ලේ ග්‍රාම නාම සහ එහි විත්ති. |
| ගා. පුරා. | - | ගාලු පුරාණය. |
| චි. පු. ස. | - | චිත්‍ර කලාව - පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ ශත සංවත්සර සමරු පොත් පෙළ. |
| තොර. ක. | - | තොරන් කවි. |
| ද. ස. වි. | - | දහඅට සන්නි විග්‍රහය. |
| දෙවො. දෙ. | - | දෙවොල් දෙවියෝ. |
| දෛ. කා. | - | දෛවඥකාමධෙනු. |
| නර්. වා. කෝ. | - | නර්තන වාක් කෝෂය. |
| නු. ක. නි. | - | නුවර කලාපයේ නිමිති ජනශ්‍රැති පර්යේෂණය. |
| ප. ශා. සා. | - | පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය. |
| පු. අනු. | - | පුරාණ අනුරාධපුරය. |
| පැ. ප්‍ර. ශි. | - | පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය. |
| පු. ප. ව. | - | පුරාණ පලදාවලිය. |
| පු. ම. ශා. | - | පුරාණ මයිමතය හෙවත් ගෙබිම් ශාස්ත්‍රය. |
| ප්‍ර. ප්‍ර. මූ. | - | ප්‍රතිමා ප්‍රමාණ මූලධර්ම. |
| ප්‍ර. සිං. ශ. | - | ප්‍රායෝගික සිංහල ශබ්දකෝෂය |
| පො. යුග. | - | පොළොන්නරු යුගය. |
| බ. පූ. වි. | - | බහිරව පූජා විමර්ශනය. |
| බි. හෙ. ශා. | - | බිම්බමාන හෙවත් ශාරිපුත්‍රය. |
| බෙ. රු. දො. | - | බෙම්තොට රුහුණු දොරටුව. |
| භ. පු. නා. | - | භරතමුනි ප්‍රණීත නාට්‍ය ශාස්ත්‍ර. |
| භා. සි. සි. | - | භාරතීය ධර්ම ශාස්ත්‍ර සහ සිංහල සිරිත් විරිත්. |
| භූත. ක. | - | භූතකරණය. |
| ම. වා. ශා. | - | මඤ්ජු ශ්‍රී භාවිත වාස්තු විද්‍යා ශාස්ත්‍ර. |

| | | |
|---|---|---|
| **ම. ස. වි.** | - | මහසොහොන් සමයම් විමර්ශනය. |
| **ම. සිං. ක.** | - | මධ්‍යකාලීන සිංහල කලා. |
| **ම. ය. ක.** | - | මහ යක් කවි පොත. |
| **ම. ලං. සං.** | - | මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය. |
| **මා. අත්.** | - | මාපලගම අත් පිටපත. |
| **මු. චි. ම.** | - | මුහුර්ති චින්තාමණී. |
| **මූ. පු. ස.** | - | මූර්ති කලාව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශත සංවත්සරය, සමරු පොත් පෙළ. |
| **ර. යා. වි.** | - | රට යකුම් යාග විග්‍රහය. |
| **ලං. ලං. ඉ.** | - | ලංකා විශ්වවිද්‍යාලයයේ ලංකා ඉතිහාසය. |
| **වාස්තු.** | - | වාස්තු සහරාව. |
| **වා. රත්.** | - | වාස්තු රත්නාවලිය. |
| **වා. ගෘ. ශි.** | - | වාස්තු විද්‍යාව හෙවත් ගෘහ නිර්මාණ ශිල්පය. |
| **වි. භා. ශා.** | - | විද්‍යෝදය විද්‍යා කලා භාෂා ශාස්ත්‍රීය සංග්‍රහය. |
| **වෛ. ත.** | - | වෛජයන්ත තන්ත්‍රය. |
| **වෛ. සා.** | - | වෛදික සාහිත්‍යය. |
| **ශා. සිං. ස.** | - | ශාන්තිකර්ම සහ සිංහල සමාජය. |
| **ශ්‍රී. පා. ස.** | - | ශ්‍රී ලංකාවේ පාරම්පරික ශිල්පි ගම් හා පාරම්පරික ශිල්පීන් ගෙන් පැවත එන පවුල් පිළිබඳ සමීක්ෂණයක්. |
| **ශ්‍රී. වාස්. වි.** | - | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයා. |
| **සට:** | - | සටහන |
| **ස. ර. ව.** | - | සද්ධර්මරතනාවලිය. |
| **සා. න. පැ.** | - | සාම්ප්‍රදායික නළු ඇඳුම් පැළඳුම්. |
| **සිං. වි. කෝ.** | - | සිංහල විශ්වකෝෂය. |
| **සිං. ස. සං.** | - | සිංහල සමාජ සංවිධානය. |
| **සිං. සැ. ක.** | - | සිංහල සැරසිලි කලාව. |
| **සිං. ශ. කෝ.** | - | සිංහල ශබ්දකෝෂය. |
| **සිං. වා. කි.** | - | සිංහළ වාස්තු කිරිත්තම. |
| **සූනි. ශා.** | - | සූනියම් ශාන්තිය. |
| **සූ. ශා. වි.** | - | සූනියම් කැපිල්ල නම් වූ ශාන්තිකර්ම විග්‍රහය. |
| **ස්තූප.** | - | ස්තූප. |
| **හ. අඩි. අ.** | - | හත් අඩි අටමහලය. |
| **හී. ස්. වි.** | - | හීන තේරීම හෙවත් ස්වප්න විස්තරය. |
| **A.C.S.** | - | Architecture, Commemorative Series. |
| **C.A.M.** | - | The Citrakarmasastra Ascribed to Manjusri. |